# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2050/46 – 2017 දෙසැම්බර් 22 වැනි සිකුරාදා – 2017.12.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

39අ(1) වැනි වගන්තිය යටතේ නියමය

1976 අප්‍රේල් මස 30 වැනි දින අංක 211 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වන අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළ කරන ලද 1976 අංක 142 හා 1976.03.12 වැනි දින දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස රජය වෙත සම්පූර්ණයෙන්ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකයද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 08 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම, පහත උපලේඛනයේ සඳහන් එම ඉඩම් කොටස මෙම නියමය මගින් අවසතු කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 03/ජේ/75/එල්/277/වීර්.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: බීඩී/ඊඑල්/එල්එන්ඩී/3/ඒකිව්යූඑස්එන්/07.
2017 දෙසැම්බර් මස 14 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
මිහිකත මැඳුර, ඉඩම් මහ ලේකම් කාර්යාලය,
1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුඹල්වෙල කෝරළයේ සුළු කොට්ඨාසයේ, අංක 71 බී දොඩම්ගොල්ල ග්‍රාම නිලධාරි වසමේ ස්ත්‍රීපුරේගම (අ.ග.සි. 275), පිටහගෙදර (අ.ග.සි. 276), උඩවාඩිය (අ.ග.සි. 277) යන ගම්හි පිහිටි, බදුල්ල දිස්ත්‍රික් මැනුම් අධිකාරි විසින් පිළියෙල කරන ලද අංක එල්ආර්සී බ/64/බ/2 හා 1974.11.05 දිනැති පිඹුරේ කැබලි අංක 89, 35,195 වශයෙන් සඳහන්, මුළු ප්‍රමාණයෙන් අක්කර 53 ක් පමණ වන කළුගලවත්ත නමැති ඉඩමෙහි පහත විස්තර කෙරෙන ඉඩම් කැබැලි :-

1. අ.ග.පි. 275 - අතිරේක අංක 1 හි කැබලි අංක 89 - ප්‍රමාණය : අක්කර 15යි පර්චස් 07
2. අ.ග.පි.276 - අතිරේක අංක 1 හි කැබලි අංක 35 - ප්‍රමාණය : අක්කර 07 යි පර්චස් 15
3. අ.ග.පි. 277 - අතිරේක අංක 1 හි කැබලි අංක 195 - ප්‍රමාණය : අක්කර 30 යි රූඩ් 03 පර්චස් 18

01-233

1A – G26844 – 22 (2017/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*